නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය
வீடமைப்பு மற்றும் சமுர்த்தி அமைச்சு
Ministry of Housing & Samurdhi

4 මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.
4 வது மாடி, செத்சிறிபாய, பத்தரமுல்ல.
4 floor, Sethsiripaya, Battaramulla.

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
வாழ்வின்எழுச்சி அபிவிருத்தி திணைக்களம்
Department of Divineguma Development

මගේ අංකය / எனது இல / My No: DDD/HO/
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2015.03.24

**දිවිනැගුම චක්‍ර ලේඛ අංක 2015/05.**

දිවිනැගුම ප්‍රජා මුල බැංකු කළමනාකරුවන්,
දිවිනැගුම ප්‍රජා මුල බැංකු සමිති කළමනාකරුවන් වෙත.

**"අපේ කම රැකගමු - සකසුරුවම ඇති කරමු."**

**<u>සිංහල/ හින්දු අළුත් අවුරුදු උත්සවයට සමගාමීව, ඉතුරුම් ප්‍රවර්ධන හා</u>**

**<u>අළුත් අවුරුදු උත්සව වැඩසටහන - 2015</u>**

**01. හැඳින්වීම.**

දිවිනැගුම ප්‍රජා මුල බැංකු හා ප්‍රජාමුල බැංකු සමිති විසින් සිංහල/ හින්දු අළුත් අවුරුද්ද බැංකු ගණුදෙනු කරුවන් හා සමස්ථ ජනතාව සමඟ උත්සවශ්‍රීයෙන් සැමරීමට අදහස් කර ඇත.

ඒ අනුව දිවිනැගුම ප්‍රජාමුල බැංකු ජාලය විසින් සිංහල/ හින්දු සිරිත් විරිත් හා ජන ක්‍රීඩා වලට මුල් තැන දෙමින් "අපේකම රැකගමු - සකසුරුවම ඇති කරමු" තේමාව යටතේ වැඩසටහන් මාලාවක් දියත් කිරීමට සැලසුම් කර ඇත.

**02. ක්‍රියාත්මක වැඩසටහන්**

i. සිංහල/ හින්දු අවුරුදු ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන.
ii. දිවිනැගුම ප්‍රජාමූල බැංකු මගින් අළුත් අවුරුදු උත්සව පැවැත්වීම.

**03. සිංහල/ හින්දු අවුරුදු ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන.**

3.1 සිංහල/ හින්දු අළුත් අවුරුද්ද අප්‍රේල් මස 14 වන දිනට යෙදී ඇත. අළුත් අවුරුද්දට ගණුදෙනු සඳහා සුභ මුර්තිය යෙදී ඇත්තේ අප්‍රේල් මස 14 වන දින අපර භාග 2.42 ට ය .එදිනටඅළුත් අවුරුදු ගණුදෙනු සඳහා සියළුම දිවිනැගුම ප්‍රජාමුල බැංකු විවෘත කර තැබිය යුතුය.

3.2 අළුත් අවුරුදු ගණුදෙනු සුභ මූර්ති වේලාවට ප්‍රජාමුල බැංකු සමඟ ගණුදෙනු කරන, ගණුදෙනුකරුවන්ට සිංහල සිරිතට අනුව බුලත් කොලයක තබා රු.10.00 ක කාසියක් තුටු පඩුරක් ලෙස ලබාදීමට කටයුතු කළ යුතුය. එම තුටු පඩුර බැංකුවට පැමින මුදල් තැන්පත් කරන ගණුදෙනුකරුවන්ට පමණක් පිරිනැමිය යුතුය. එම කාර්යයට පෙර සූදානමක් ඇතිකර ගත යුතු අතර, වැය වන වියදම වැය ගිණුම - බැංකු ප්‍රවර්ධන ගිණුමට හර කර සටහන් කළ යුතුය.

3.3 සිංහල/ හින්දු අළුත් අවුරුද්දට සමගාමීව ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහනක් ද අප්‍රේල් මස 14 වන දින සිට 20 දක්වා එම දෙදින ද ඇතුළත්ව සතියක් පුරාවට සියළුම ග්‍රාම නිලධාරී වසම් සිසාරා ක්‍රියාත්මක කෙරේ.

3.4 ඒ සඳහා දිවිනැගුම ප්‍රජාමූල බැංකු බල ප්‍රදේශයේ වසම් වලසේවය කරන සියළුම දිවිනැගුම නිලධාරීන්ට ඉලක්ක ලබාදෙන අතර, ඒ අනුව එක් වසමකින් සියළුම ගිණුම් සඳහා තැන්පතු ලෙස රු.75,000/- ක් හෝ ඊට වැඩි මුදලක් රැස්කිරීමට ඉලක්කයක් ලබාදිය යුතුය.

3.5 මෙම ඉතුරුම් ප්‍රවර්ධන සතිය තුළ ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීමට පාලක මණ්ඩල සාමාජිකයන් හා ප්‍රජාමූල සංවිධාන වල නිලධාරීන්ව සෘජු ලෙස දායක කරගත යුතුය.

3.6 ඉතුරුම් ප්‍රවර්ධන සතිය හා අළුත් අවුරුදු ගණුදෙනු සඳහා තැන්පත් කරන මුදල් අවුරුද්දක් පුරාවට බැංකුවේ තැන්පතු ලෙස රඳවාගැනීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කළ යුතුය.

3.7 අළුත් අවුරුදු ගණුදෙනු අවස්ථාව හා ඉතුරුම් ප්‍රවර්ධන සතිය තුළ ගිණුම් වල තැන්පත් කරන ගණුදෙනුකරුවන්ට සිහිවටනයක් ලෙස තිළිණයක් ලබාදීම කළ යුතුය. එහිදී මෙම වැඩසටහන් තුළ රැස්කරන

මුළු මුදලින් 5% ක් නොඉක්මවන මුදලක් තෑගි මිලදී ගෙන ලබාදීමට වැය කළ හැකිය. තෑගි තෝරාගැනීමේ දී බැංකුවේ තැන්පත් ප්‍රවර්ධනය වන, බැංකු සපයන සේවාවන් පුළුල්වන, ගණුදෙනුකරුවන්ට ඵලදායී ප්‍රයොජනයක් ලබාගත හැකි තිළිණයක් ලබාදීමට කළමනාකරු කටයුතු කළ යුතුය.

3.8 සිහිවටන මිලදීගැනීමේ දී, මූල්‍ය විනිවිදභාවය රැකෙන පරිදි පාලක මණ්ඩල අනුමැතියට යටත්ව සිදුකළ යුතුය. වැය වන වියදම වැය ගිණුම - බැංකු ප්‍රවර්ධන ගිණුමට හර කර ප්‍රවේශන තැබීමට ද උපදෙස් ලබාදෙන්නෙමු.

3.9 අළුත් අවුරුදු ගණුදෙනු හා ඉතුරුම් ප්‍රවර්ධන සතිය තුළ රැස් කරන ලද ඉතුරුම් මුදල් සම්බන්ධ ප්‍රගතිය පහත පරිදි ඒ ඒ අංශ විසින් යොමු කළ යුතුය.

| **බැංකුව/ අංශය** | **වාර්තා ලබාදිය යුතු බැංකුව/ අංශය** | **වාර්තා යොමු කළ යුතු දිනය** | **වගකීම දරණ නිලධාරියා** | **භාවිතා කළයුතු ආකෘති පත්‍රය** |
|---|---|---|---|---|
| ප්‍රජා මූල බැංකුව | ප්‍රජා මූල බැංකු සමිතිය | 2015.04.24 | බැංකු කළමනාකරු | ඇමුණුම-01 |
| ප්‍රජා මූල බැංකු සමිතිය | දිවිනැගුම දිස්ත්‍රික් අංශය | 2015.04.30 | බැංකු සමිති කළමනාකරු | ඇමුණුම-02 |
| දිවිනැගුම දිස්ත්‍රික් අංශය | ප්‍රජා මූල බැංකු අංශය | 2015.05.05 | දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ | ඇමුණුම-03 |

**04. බැංකු කලාප මට්ටමින් අළුත් අවුරුදු උත්සව පැවැත්වීම.**

4.1 දිවයිනපුරා පිහිටි සියළුම දිවිනැගුම ප්‍රජාමූල බැංකු තම කලාපය තුළ එක් අවුරුදු උත්සවයක් සංවිධානය කර පැවැත්වීම අනිවාර්ය වේ.

4.2 අළුත් අවුරුදු උත්සවය 2015.04.19 වන ඉරිදා දින දවස පුරා පැවැත්වීමට කටයුතු කළ යුතුය. ඒ අනුව එකම දිනයක් තුළ අළුත් අවුරුදු උත්සව 1074 ක් පැවැත්වීමට යෝජිතය.

4.3 ඡේද අංක 4.2 හි සඳහන් පරිදි, විශේෂ හේතුවත් මත අවුරුදු උත්සවය පැවැත්වීමට නොහැකි වන විට පමණක් එළඹෙන සතියේ සති අන්ත දිනයක් තෝරා ගත යුතුය. ඒ සඳහා පූර්ව අනුමැතිය දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂකගෙන් ලබාගත යුතුය. ඒ පිළිබඳව ප්‍රජාමූල බැංකු අංශය දැනුවත් කිරීම අනිවාර්ය වේ.

4.4 ජන ක්‍රීඩා වලට මුල්තැන දෙමින් බැංකු කටයුතු ප්‍රවර්ධනය වන අයුරින් අවුරුදු උත්සවය පැවැත්විය යුතුය.

4.5 දිවිනැගුම ප්‍රජා මූල බැංකු විසින් සංවිධානය කරන බක්මහ උළෙල සඳහා අවශ්‍ය වියදම් පිරිමසාගැනීමට රු.40,000/- ක උපරිම මුදලක් වැය කිරීමට අවසර දෙන අතර, එම වියදමෙන් රු.15,000/- ක් ප්‍රජා මූල බැංකු අංශය බැංකුවට ප්‍රතිපූරණය කරන අතර, වැය වන ඉතිරි මුදල බැංකු අරමුදලින් දරා ගත යුතුය. ඒ සඳහා පහත ගිණුම් සටහන් තැබිය යුතුය.

හර - දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපූරණය කරගත යුතු අරමුදල් ගිණුම

හර - වැය ගිණුම උත්සව කටයුතු (බැංකුවෙන් දරණ මුදල)

බැර - ජංගම ගිණුම/ මුදල් ගිණුම

4.6 අවුරුදු උත්සවය පවත්වා අප්‍රේල් මස 30 ට පෙර ප්‍රතිපූරණය කරගත යුතු මුදල් සම්බන්ධ තොරතුරු ආකෘති පත්‍ර 4 ට අනුව සම්පූර්ණ කර ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශ සහිත දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ වෙත යොමු කළ යුතුය. දිස්ත්‍රික් දිවිනැගුම අංශයේ ක්ෂුද්‍රමූල්‍ය කළමනාකරු විසින් දිස්ත්‍රික්කයේ සියළු බැංකු වලින් ඉල්ලීම් කරන ලද ප්‍රතිපූරණ මුදල් සම්බන්ධ වාර්තාව 2015 මැයි 10 ට පෙර ප්‍රජා මූල බැංකු අංශයට යොමු කිරීම අනිවාර්ය වේ. ඉන් අනතුරුව කරන ඉල්ලීම් සම්බන්ධව ප්‍රතිපූරණ මුදල් ලබාදීම සිදු නොකෙරේ.

4.7 අළුත් අවුරුදු උත්සවය සඳහා බාහිර සංවිධාන/ පාර්ශව වල සහාය හා ආධාර ලබාගැනීමට හැකියාව ඇති අතර, ඒ සම්බන්ධ ලිපි ගොනු ක්‍රමවත් ලෙස නඩත්තු කිරීම කළ යුතුය.

## 05. දිවිනැගුම ප්‍රජාමූල බැංකු සමිතියේ කාර්ය භාරය

5.1 ජාතික හා දිස්ත්‍රික් ඉලක්ක කරා වැඩසටහන ඉදිරියට ගෙන යාමට සහාය ලබාදෙමින් බැංකු සමිති ඉලක්කය සපුරාගැනීමට කටයුතු කළ යුතුය. (ඔබ බැංකු සමිති බල ප්‍රදේශයේ සියළු වසම් වල ඉලක්ක එකතු කර බැංකු සමිති ඉලක්කය සකස් කර ගත යුතුය.)

5.2 බැංකු සමිති බල ප්‍රදේශයට අයත් සියළුම බැංකු වල අවුරුදු ගණුදෙනු, ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන හා අළුත් අවුරුදු උත්සවය පැවැත්වීමට බැංකු සමිති කළමනාකරුගේ මග පෙන්වීම හා අධීක්ෂණය ලබාදිය යුතුය.

5.3 වැඩසටහන් වල ප්‍රගතිය දී ඇති උපදෙස් පරිදි දිස්ත්‍රික් දිවිනැගුම අංශයට යොමු කළ යුතුය.

5.4 අළුත් අවුරුදු උත්සවය සඳහා විධායක කමිටු සාමාජිකයන්ගේ දායකත්වය ලබාදීම හා ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන පිළිබඳ දැනුවත් කිරීම ප්‍රජා සංවිධාන හරහා සිදු කළ යුතුය.

## 06. දිස්ත්‍රික් දිවිනැගුම අංශයේ කාර්ය භාරය

6.1 දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති සඳහා මෙම චක්‍රලේඛනයේ උපදෙස් පරිදි අදාල වැඩසටහන සාර්ථකව සංවිධානය කර ඉලක්ක සපුරාගැනීමට දැනුවත් කළ යුතුය.

6.2 ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන යටතේ වසමකට ලබාදී ඇති ඉලක්කය හා දිස්ත්‍රික්කය සියළුම වසම් ගණන අනුව දිස්ත්‍රික්කයේ ඉලක්කය සකස් කරගැනීම.

6.3 අළුත් අවුරුදු උත්සවය පැවැත්වීමට නියමිත දිනය හැර වෙනත් දිනයක් තෝරාගැනීමට කරන ඉල්ලීම් වල දී ඔබගේ අනුමැතිය ලබාදීමට පෙර ඒ පිළිබඳ පිළිගතහැකි හේතුවක් ඇත්නම් පමණක් අනුමැතිය ලබාදීම හා ඒ පිළිබඳව ප්‍රජාමූල බැංකු අංශය දැනුවත් කිරීම.

6.4 අළුත් අවුරුදු ගණුදෙනු හා අළුත් අවුරුදු උත්සවය සඳහා දිස්ත්‍රික් දිවිනැගුම අංශයේ කාර්ය මණ්ඩලයේ සහභාගීත්වය ලබාදීම.

6.5 ප්‍රගති වාර්තා නිසි පරිදි ලබාගෙන ප්‍රජාමූල බැංකු අංශයට යොමු කිරීම.

## 07. නිලධාරීන් ඇගයීම හා ප්‍රශංසා සහතික ලබාදීම.

7.1 දිවිනැගුම ප්‍රජාමූල බැංකු සමිති විසින් බැංකු බල ප්‍රදේශයේ වසම් සඳහා දී ඇති ඉලක්කය ඉක්මවා වැඩිම තැන්පතු මුදලක් රැස්කරන ලද නිලධාරීන් 10 දෙනා තෝරාගෙන ප්‍රාදේශීය ලේකම්ගේ මග පෙන්වීම යටතේ සමරු සටහනක් හා ප්‍රශංසා සහතිකයක් ලබාදීම.

7.2 ප්‍රජාමූල බැංකු සමිති විසින් ඇගයීම් වැඩසටහන සංවිධානය කිරීමට රු.10,000/- ක් නොඉක්මවූ මුදලක් බැංකු සමිති අරමුදලින් වැය කිරීමට අවසර ඇත. වැය වන මුදල වැය ගිණුම - උත්සව කටයුතු වියදම් ගිණුමට හර කළ යුතුය.

7.3 දිස්ත්‍රික් දිවිනැගුම අංශය, ඉහළම තැන්පතු මුදලක් රැස්කරන බැංකු කළමනාකරුවන්, ප්‍රජාමූල බැංකු සමිති කළමනාකරුවන්, බැංකු/ බැංකු සමිති කාර්ය මණ්ඩලය සඳහා ප්‍රශංසා සහතික ලබාදිය යුතුය. ඒ සඳහා දිස්ත්‍රික්කයේ බැංකු/ බැංකු සමිති 10 බැගින් තෝරාගත යුතුයි.

7.4 දිස්ත්‍රික් දිවිනැගුම අංශය විසින් දිස්ත්‍රික්කයේ වසම් මට්ටමින් ඉහළම තැන්පතු මුදලක් රැස්කරන ලද ක්ෂේත්‍ර නිලධාරීන් 25 දෙනා තෝරා ප්‍රශංසා ලිපි ලබාදිය යුතුය.

7.5 ප්‍රජාමූල බැංකු සමිති / දිස්ත්‍රික් දිවිනැගුම අංශ මගින් ඇගයීමට ලක්කිරීම සිදුකළ යුත්තේ මෙම උපදෙස් වල සඳහන් දිනට ඉදිරිපත් කරන වාර්තා ඇසුරින් පමණි.

7.6 මෙම වැඩසටහන පිළිබඳ ජාතික මට්ටමින් නිලධාරීන් ඇගයීමක් ඉදිරි දිනක ප්‍රජා මූල බැංකු අංශය සිදුකරන බව ද තවදුරටත් දන්වා සිටිමු.

08. 2015.04.14 දින විශේෂිත රාජකාරියක නිරත වන බැවින්, බැංකු කාර්ය මණ්ඩලයට පමණක් එදින දිනක වැටුපක් ලබාගැනීමට අනුමැතිය ලබාදෙන්නෙමු.

09. විශේෂ කරුණු

9.1 2015 ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන යටතේ ඉතුරුම් ගිණුම් සඳහා වර්ගීකරණයක් නොමැතිව දිවිනැගුම ප්‍රජාමූල බැංකු වල ක්‍රියාත්මක සියළුම තැන්පතු ගිණුම් වලට තැන්පතු රැස්කිරීම කළ යුතුය.

එච්.සුමනපාල,

අධ්‍යක්ෂ ජනරාල්.

**පිටපත් :-**

1. ලේකම්, නිවාස හා සමෘද්ධිකටයුතු අමාත්‍යාංශය. - කා.දැ.ස.
2. සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්, - කා.දැ.ස
3. සියළුම ප්‍රදේශිය ලේකම්වරුන්. - කා.දැ.ස.
4. සියළුම දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂවරුන්, - කා.දැ.ස.
5. ප්‍රධාන අභ්‍යන්තර විගණක, දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ස.